
# 2.1

# පදවල තාර්කික සම්බන්ධය ගොඩ නැගෙන ආකාරය විග්‍රහ කරයි.



පැවරුම්

1) කොටුකර ඇති වාක්‍ය අසත්‍යය

A. ඉහත සඳහන් ප්‍රකාශනය සත්‍ය ද ? අසත්‍ය ද? යන්නට සෘජු පිළිතුරක් දීමේදී මතුවන ගැටළුව පැහැදිලි කරන්න.

B. භාෂාවේ යෙදෙන,

i. ආවේගාත්මක

ii. ඇගයුම්ශීලී

iii. විස්තරාත්මක ලක්ෂණ එකක් එකක් නිදසුන් දෙමින් පහදන්න.

2)

A. (a). වාක්‍ය හා ප්‍රස්තුත අතර වෙනස්කම් දක්වන්න.

(b). පහත සඳහන් භාෂාමය ප්‍රකාශන ප්‍රස්තුත ලෙසින් ගත හැකිද? නැද්ද යන්න සඳහන් කරන්න.

i. අහෝ ! දෙව්දත් නොදිටි මොක්පුර.

ii. ලන්ඩන්, ලස්සනයි නේද? ලුසාකා.

iii. ගණිත සමීකරණය නගරයට යයි.

iv. ඔහු හොඳ ළමයෙකි.

v. මහනුවරට උතුරින් මාතලේ පිහිටා ඇත.

B. පහත සඳහන් වාක්‍ය සත්‍ය හෝ අසත්‍ය වන්නේ සංශ්ලේෂී වශයෙන්ද , විශ්ලේෂී වශයෙන්ද, රූපික වශයෙන්ද යන්න දක්වන්න.

i. එක්කෝ ඇය විවාහකය නැත්නම් අවිවාහකය.

ii. වැන්දඹුව සිය සැමියා සමඟ නගරයට යයි.

iii. පේරාදෙණියේ මල් වත්තක් ඇත.

iv. සිංහයා ශාක භක්ෂකයෙකි..

v. අන්ධයා ඇස් නොපෙනෙන අයෙකි.

vi. පෘථිවිය ගෝලාකාර නම් හා නම් පමණක් පෘථිවිය ගෝලාකාර නොවේ.

අන්තර්ගතය සකස් කිරීම : ප්‍රිතිමා සෙනෙවිරත්න මිය, කෑ/ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය,කෑගල්ල .
පරිගණක පිටු සැකසුම : ජී.ඩී.සී.එන්.ගමගේ මෙය, මො/මහානාම මධ්‍ය මහා විද්‍යාලය,මොනරාගල.
අන්තර්ගතය පරීක්ෂා කිරීම : කථිකාචාර්ය තරංග ධරණීත මයා, දර්ශන අධ්‍යයනාංශය, කැලණිය වි.වි

Copyright © www.e-thaksalawa.moe.gov.lk

3)

A. පහත සඳහන් ඒවා සාමාන්‍ය, ඒකවාචී, සාමූහික යන වර්ග අතරින් කුමකට ගැනේද?

i. ශ්‍රී ලංකාවේ ජනාධිපති.

ii. ශ්‍රී ලංකා පාබල හමුදාව.

iii. මේ පන්තියේ උසම ළමයා.

iv. පුස්තකාලය

v. ජුලියස් සීසර්.

vi. රෝහල

vii. සිංහල මිනිසා.

viii. මකරා

B. පහත සඳහන් සාපේක්ෂක පදවල තාර්කික සම්බන්ධතා නම් කරන්න.

i. කලත්‍රයා.

ii. පූර්වජයා.

iii. මාමා.

iv. $3 > 2$ (තුන විශාලයි 2 ට වඩා)

v. A,B ට වඩා වැඩිමල්ය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk